# ඓතිහාසික ගණේකන්ද පුරාණ රාජමහ විහාරය පිළිබඳ මූලික ගවේෂණය

ආර් එම් දර්ශන රණබාහු[1]
පී. වී. ඩී. ද සිල්වා[2]

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
[1]darshana@gmail.com
[2]vdhananjaya59@gamil.com

---

වයඹ පළාතේ දඹදෙණිය හත්පත්තුවේ උඩුකහ නැගෙනහිර කෝරලයේ අලව්ව ග්‍රාමයේ නාරම්වල එකේ කණුව ආසන්නයේ ඓතිහාසික ගණේකන්ද පුරාණ රජමහා විහාරය පිහිටා තිබේ. වලගම්බා රජු සත් ද්‍රවිඩ ආක්‍රමණය නිසා මලය දේශයට පලා යන ගමනේ එක් නැවතුම්පලක් ලෙස ගනේකන්ද ප්‍රදේශය භාවිත කරන්නට ඇති බව ජනප්‍රවාදයෙහි කියැවේ. මෙම ගනේකන්ද ප්‍රදේශයේ සිට වලගම්බා රජු සේනා සංවිධානය කළ බවත් නැවත යුද ජයග්‍රහණය ලබා රාජ්‍යත්වයට පත් වූ පසු තමන් නැවතී සේනා සංවිධානය කළ ස්ථානයන්වල ආරාම ඉදි කර සඟ සතු කොට පූජා කර බව කියැවෙන අතර ඓතිහාසික ගණේකන්ද පුරාණ රාජමහ විහාරය ද එසේ පූජා කරන ලද්දක් බව කියැවේ. ඓතිහාසික ගණේකන්ද පුරාණ රාජමහ විහාරයට එම නම යෙදී ඇත්තේ අතීතයේ එක්තරා කාලයක ගණින්නාන්සේලා මෙම ප්‍රදේශයේ වාසය කළ හෙයිනි. මෙම විහාරය ගල් පර්වත කිහිපයක් මත පිහිටා ඇත. ගල් කන්දේ ඉහල ගල් දුන්නක් දක්නට ලැබෙන අතර පැතලි ගල් තට්ටු කිහිපයක් එක මත එක තබා සකස් කල ආයුධයක් ලෙස එය හඳුනාගත හැකි ය. පර්වතය මත පිහිටා ඇති බැවින් මෙම ස්ථානය ආක්‍රමණය කරන්නට පැමිණෙන සතුරු සේනාවන් මතට පර්වතය මුදුනේ සිට මෙම ගල් තට්ටු පතිත කරන්නට ඇති බව ජනතා විශ්වාසය වේ.

ගණේකන්ද රාජමහ විහාරයේ බුදු කුටිය ද ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු වන බව පෙනී යයි. මෙම බුදු කුටිය ගල් ලෙනක් ඇතුළතට වන්නට ගල් පියස්සකින් ආවරණය වන පරිදි නිර්මාණය කර ඇත. බුදු කුටිය වැසි ජලයෙන් ආරක්ෂා කිරීමට ලෙන මත කටාරම් ද කොටා ඇති බව දක්නට ලැබේ. මෙම බුදු කුටිය තුළ ඉපැරණි චිත්‍ර තිබූ බවට සාධක ඇති අතර යම් තැනැත්තෙකු සම්පූර්ණයෙන් බිත්තිය මත හුණු බදාම ආලේප කොට ඒවා විනාශ කර ඇත. මෙහි ප්‍රතිසංස්කරණය කරන ලද පැරණි බුද්ධ ප්‍රතිමාවක් ද දක්නට ලැබෙන අතර නිධන් සොරුන් විසින් ආසනගල හැරීම සඳහා එය විනාශ කර ඇත. බුදු කුටියට පිවිසෙන ස්ථානයේ අනර්ඝ මකර තොරණක් දැකිය හැකිය. මෙම විහාරයේ ලෙන් කිහිපයක් ඇතත් ඒවායේ ඇතැම් ලෙන් පාංශු සෝදාගෙන යාම නිසා වැසී ගොස් ඇත. බුදු කුටියේ බාහිරින් සිංහල උළු යෙදූ පියස්සක් දකිය හැකි ය. 2004 වර්ෂයේ දී එය පිලිසකර කර ඇත. කුඩා දිය පොකුණක් ද එයට පහළින් නිර්මාණය වී තිබේ. රජු සේනා සංවිධානය කරන අවධියේ දී සතුරන් පිළිබඳව විමර්ශනය කරන ලද බැලුම්ගල හා හේවිසි ගලක් ද දැකගත හැකි ය. බැලුම්ගල පාමුල ගල් කුටියක් තිබී ඇති මුත් වර්තමානයේ දී එය දැකගත නොහැකිය. පැරණි බුද්ධ ප්‍රතිමාව හා විහාරයේ ඇතැම් ස්ථාන නිදන් හොරුන්ට බිලි වී ඇතැයි සිතිය හැකි අයුරින් සාධක හමු විය. මෙම ස්ථානය නිරීක්ෂණය කොට ලබා ගත් දත්තවලින් ඓතිහාසික ගණේකන්ද පුරාණ රාජමහ විහාරයේ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. අතීතයේ දී විශාල භූමි ප්‍රමාණයක පැතිර තිබුණ ද වර්තමානයේ අක්කර 2 ක පමණ භූමි භාගයකට විහාර භූමිය සීමා වී ඇත. වර්තමානයේ වනයෙන් වැසී ඇති බැවින් නිදන් හොරුන්ගේ තර්ජනයට පත් වී ඇති මෙම ස්ථානය පිළිබඳව තවදුරටත් ක්ෂේත්‍ර ගවේෂණ සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : ගණේකන්ද රාජමහ විහාරය, ක්ෂේත්‍ර ගවේෂණ,